# ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

# පුරප්පාඩු

# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)
## (පුරප්පාඩු 01)

**(1) රැකියා විස්තරය**

ආයතනයේ ප්‍රධාන ශ්‍රිතයික කාර්යයන් දෙකක් වන තහනම් උත්තේජක පරීක්ෂණ හා දැනුවත් කිරීමේ වැඩසටහන් නිසි පරිදි සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, තහනම් උත්තේජක පරීක්ෂණ ප්‍රතිඵල කළමනාකරණය, තහනම් උත්තේජක භාවිතා කළ බවට සනාථ වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ විනය පරීක්ෂණ පැවැත්වීම හා ඒවා විශ්ලේෂණය කිරීමට දායකත්වය ලබා දීම, චිකිත්සක භාවිතා මුක්තිය පිළිබඳ කටයුතු අධීක්ෂණය හා ආයතනයේ අරමුණු කරා ගෙන යාම සඳහා යටත් කාර්ය මණ්ඩලය මෙහෙයවීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ නිසි පරිදි ක්‍රියාවේ යෙදවීම, ආයතනය පිහිටුවීමට අදාළ වූ පනත මගින් පවරනු ලබන කාර්යයන් හා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරා දෙනු ලබන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

**(2) සුදුසුකම් හා පළපුරුද්ද**

(2.1) බාහිර අයදුම්කරුවන්

(අ) වෛද්‍ය විද්‍යාව / ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Master) ලබා තිබීම.

සහ

රජයේ,රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ"තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂෙත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුදක් ලබා තිබීම.

(2.2) අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 01 හෝ 02 )

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(ආ) ආයතනයෙහි කළමනාකාර සේවා ගණයෙහි(MM )සේවා I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහක් (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**(3) වැටුප් පරිමාණය**

HM 1-1-2016 - (රු.80,295 - 15×2,270 = රු.114,435)

**(4) වයස**

අවු: 35 ට නොඅඩු හා අවු: 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**(5) බඳවා ගැනීමේ ක්‍රමය.**

(5.1) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බාහිර අයදුම්කරුවන් බඳවා ගැනේ.

(5.2) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනේ.

## පර්යේෂණ නිලධාරී
## (පුරප්පාඩු 01)

**(1) රැකියා විස්තරය**

තහනම් උත්තේජන වලින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වලක්වා ගැනීම සම්බන්ධයෙන් අදාළ අධ්‍යයන හා පර්යේෂණ ව්‍යාපෘති නිසි ප්‍රමිතීන්ට අනුව ක්‍රියාත්මක කිරීම වෙනුවට අදාළ ව්‍යාපෘති යෝජනා හා කාලීන ගැටළු ප්‍රධාන විධායක යොමු කිරීම හා අදහස් හුවමාරු කර ගැනීම ප්‍රධාන විධායක විසින් පවරනු ලබන රජකාරී ඉටු කිරීම. වෘත්තීය සංවර්ධනය සඳහා අවශ්‍ය වන දැනට තාක්ෂණය හා කුසලතා නිශ්චිත කාලයක් තුළ සම්පූර්ණ කිරීම, කාර්යය මණ්ඩලය වෙත දත්ත තොරතුරු ඉදිරිපත් කිරීම තිරීක්ෂණය, ඇගයීම, ලේඛන කිරීම. මීට අමතරව ආයතන ප්‍රධානියා විසින් හෝ බලය පවරන ලද නිලධාරියෙකු විසින් වෙනත් අදාළ රාජකාරි කටයුතු ඉටු කිරීම.

**(2) සුදුසුකම් හා පළපුරුද්ද**

(2.1) බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් (අ) හෝ (ආ) හෝ (ඇ) )

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් භෞතික විද්‍යා, ජීව විද්‍යා හෝ අදාළ විද්‍යා ක්ෂේත්‍රයේ ධීවර හා සාගර විද්‍යාවසත්ත්ව විද්‍යාව / උද්භිත විද්‍යාව / රසායන විද්‍යාව / භෞතික විද්‍යාව / කෘෂි විද්‍යාව /ධීවර තාක්ෂණය / සාගර විද්‍යාව / ජලජීවී විද්‍යාව / ඉංජිනේරු / ආහාර විද්‍යාව හා තාක්ෂණය / අනුක ජීව විද්‍යාව / ස්වභාවික විද්‍යාව / භූ විද්‍යාව / පශු වෛද්‍ය / සමුද්‍රජීව විද්‍යාව / පරිසර විද්‍යාව / අලෙවිකරණය / සංඛ්‍යානය / ආර්ථික විද්‍යාව / සමාජ විද්‍යාව / භූගෝල විද්‍යාව / පරිගණක විද්‍යාව විෂය සංකලනයන් සහිතව පළමු පන්ති හෝ දෙවන පන්ති (ඉහළ) සමාර්ථයක් සහිත සිව් අවුරුදු විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් භෞතික විද්‍යා, ජීව විද්‍යා හෝ අදාළ විද්‍යා ක්ෂේත්‍රයේ ධීවර හා සාගර විද්‍යාව සත්ත්ව විද්‍යාව / උද්භිත විද්‍යාව / රසායන විද්‍යාව / භෞතික විද්‍යාව / කෘෂි විද්‍යාව / ධීවර තාක්ෂණය / සාගර විද්‍යාව / ජලජීවී විද්‍යාව / ඉංජිනේරු / ආහාර විද්‍යාව හා තාක්ෂණය / අනුක ජීව විද්‍යාව / ස්වභාවික විද්‍යාව / භූ විද්‍යාව / පශු වෛද්‍ය / සමුද්‍රජීව විද්‍යාව / පරිසර විද්‍යාව / අලෙවිකරණය / සංඛ්‍යානය / ආර්ථික විද්‍යාව / සමාජ විද්‍යාව / භූගෝල විද්‍යාව / පරිගණක විද්‍යාව විෂය සංකලනයන් සහිතව සමාන්‍ය උපාධියක් සමග අදාළ විෂය ක්ෂේත්‍රයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

හෝ

(ඇ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සමාජිකත්වය ලබා තිබීම.

(2.2) අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 01 හෝ 02 )

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(ආ) ආයතනයෙහි අධ්‍යයන / පර්යේෂණ කාර්යයන්ට අදාළ තනතුරක් දරන "ක්‍රියාත්මක කිරීමේ / උපදේශන(MN4)" සේවා ගණයෙහි හෝ "බලාත්මක කිරීමේ / ක්‍රියාත්මත කිරීමේ ව්‍යාප්ති නිලධාරි" කළමනාකාර සේවා ගණයෙහි (MN5) සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර අටක (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිම

**(3) වැටුප් පරිමාණය**

A.R. 1 -2016 - (රු.53,150 - 10X1,375 - 15×1,910= රු.95,550)

**(4) වයස**

අවු: 22 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**(5) බඳවා ගැනීමේ ක්‍රමය**

ලිඛිත තරග විභාගයකින් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

## තාක්ෂණ සහකාර (පර්යේෂණාගාර)
## (පුරප්පාඩු 01)

**(1) රැකියා විස්තරය**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ විද්‍යාගාරයේ පර්යේෂණ කටයුතු සහ විශලේෂණ කටයුතු සිදු කිරීමට තාක්ෂණික වශයෙන් සහය වීම, විද්‍යාගාරයේ පවත්නා අධි තාක්ෂණික විද්‍යාගාර උපකරණ භාවිතය සහ පර්යේෂණ සාම්පල සැකසීම, ද්‍රාවන පිළියෙළ කිරීම, අනෙකුත් විශ්ලේෂණ කටයුතු, විද්‍යාගාර උපකරණ ක්‍රියා කරවීම Method ලිවීම, දත්ත ඇතුළත් කිරීම සහ අදාළ පරිදි ප්‍රතිඵල ලබා ගැනිම, රසායන ද්‍රව්‍ය, විද්‍යාගාර උපකරණ ඇතුළු පර්යේෂණාගාරයට අවශ්‍ය භාණ්ඩ වල අදාළ සංචිත පවත්වාගෙන යාම, නිසි වේලාවට ඇණවුම් කර ගෙන්වා ගැනීම සහ වාර්තා තබා ගැනීම, විද්‍යාගාර උපකරණ තඩත්තුව සහ සේවා සම්බන්ධය අදාළ වගකිවයුතු ආයතන සමග සම්බන්ධතා පවත්වා ගනිමින් අදාළ කාර්යන් නියමිත කාලසීමාව තුළ සුදු කිරීම, රසායනාගාර සහයක වැනි ප්‍රාථමික කාර්ය මණ්ඩලය අධීක්ෂණය හා මෙහෙය වීම. පර්යේෂණාගාරයේ දෛනික කටයුතු Good Laboratory Practices වලට අනුකූලව සහ ආරක්ෂණ ක්‍රම වලට අනුකූලව සිදුවන බව අධීක්ෂණය කිරීම, කාලෝචිත ආකරයකින් ගුණාත්මක සේවාවන් සැපයීම ඇතුළුව වෘත්තීය පාරිභෝගික සම්බන්ධතාවයක් (අභ්‍යන්තර හා බාහිර) පවත්වාගෙන යාමට පර්යේෂණ අංශයට සහාය වීම.නව විද්‍යාගාර උපකරණ මිලදී ගැනීමේදී ටෙන්ඩර් ක්‍රියාවලියට ගිණුම් අංශයට අදාළ තාක්ෂණික සහය ලබා දීම හා පර්යේෂණ නිලධාරින් විසින් පවරන ලබන වෙනත් රාජකාරි.

**(2) සුදුසුකම් හා පළපුරුද්ද**

(2.1) බාහිර අයදුම්කරුවන්

(අ) තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) පහ ( 05) වැනි මට්ටමක අදාළ ක්ෂේත්‍රයේ පිළිබඳ ප්‍රවීනතා සහතියක් ලබා තිබීම.

(2.2) අභ්‍යන්තර අයදුම්කරුවන්

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**(3) වැටුප් පරිමාණය**

MA 2-1 -2016 - (රු.30,310 - 10×300 - 07×350 - 04X495 -20X660= රු.50,940)

**(4) වයස**

අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**(5) බඳවා ගැනීමේ ක්‍රමය**

ලිඛිත තරග විභාගයකින් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

❖ ඉහත තනතුරු සඳහා පොදු කොන්දේසි

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

(I) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(II) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

(III) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

❖ අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්පත්,සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

❖ ඉහත සඳහන් සියලු තනතුරු ස්ථිරය, සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා හිමිකම් සහිතය. (අපේක්ෂකයින්විසින් 8% ක් හා ආයතනය විසින් 12% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3%ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහාද දායක වනු ඇත.)

❖ **අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය**

අයදුම්කරුවන් විසින් සහතිකපත්, චරිත සහතික වල පිටපත්, ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකද සමග තම ජීව දත්ත තොරතුරු 2023.12.07වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, 363 / 12, සුගතදස ස්ටේඩියම් - බ්ලොක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

❖ එසේ නොවන සහ අයදුම්පත් භාර ගන්නා දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

❖ රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළයුතුය. අයදුම්පත බහාලන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම්කරන ලද තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය.**

**011-3071838**